පේරාදෙණිය විශ්වවිද්‍යාලය

# UNIVERSITY OF PERADENIYA

දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යයන කේන්ද්‍රය

## CENTER FOR DISTANCE & CONTINUING EDUCATION

ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි (බාහිර) පරීක්ෂණය දෙසැම්බර් 2017

**ඉතිහාසය I ( HG I )**

**ක්‍රි.ව. 320 දක්වා උතුරු ඉන්දියාවේ ඉතිහාසය**

කාලය පැය 03යි.

යටත් පිරිසෙයින් **එක්** කොටසකින් **එක්** ප්‍රශ්නය බැගින් තෝරා ගෙන ප්‍රශ්න **හතරකට** (4 ) පමණක් පිළිතුරු සපයන්න.

සුදුසු තන්හි දළ සිතියම් මගින් ඔබේ පිළිතුර පහදන්න.

නොපැහැදිලි අත්අකුරුවලට ලකුණු කපාහරිනු ලැබේ.

මෙම ප්‍රශ්න පත්‍රයෙහි අඩංගු මුළු ප්‍රශ්න සංඛ්‍යාව දොළස (12) කි.

---

### පළමු කොටස

01. හරප්පා ශිෂ්ටාචාරය සමකාලීන අනෙකුත් සභ්‍යත්ව සමඟ පැවැත් වූ සබඳතා පරීක්ෂා කරන්න.

02. පුරාතන ඉන්දියානු ඉතිහාසය හැදෑරීමෙහිලා ඍග් වේදයට හිමිවන වැදගත්කම සාකච්ඡා කරන්න.

03. "ආර්ය සංකල්පය" පිළිබඳ ඇති මතවාද පරීක්ෂා කරන්න.

04. "උපනිෂද් චින්තනය බුදුන් වහන්සේගේ හා ජෛන මහාවීරයන්ගේ ඉගැන්වීම් කෙරෙහි තීරණාත්මක බලපෑමක් ඇති කළේය" යන මතය ඔබ කෙතෙක් දුරට අනුමත කරන්නෙහිද?

### දෙවෙනි කොටස

05. බිම්බිස්සාර සහ අජාතසත්තුගේ දේශපාලන ක්‍රියාවලිය පැහැදිලි කරන්න.

06. පුරාතන ඉන්දියානු ඉතිහාසය හැදෑරීමෙහිලා කෞටිල්‍ය **අර්ථශාස්ත්‍රයට** හිමිවන වැදගත්කම සාකච්ඡා කරන්න.

07. අශෝක සෙල්ලිපිවල ඓතිහාසික වැදගත්කම පරීක්ෂා කරන්න.

08. ශුංග රාජවංශය යටතේ උතුරු ඉන්දියාවේ කලා හා ගෘහනිර්මාණය පිළිබඳ රචනයක් ලියන්න

## තෙවන කොටස

09. ඉන්දු-ග්‍රීක පාලක මිනැන්ඩර්ගේ කාර්ය සංසිද්ධිය ප්‍රමාණ කරන්න.

10. කුෂාණ සමයේ ජනප්‍රිය වූ ගාන්ධාර හා මථුරා කලා සම්ප්‍රදායන්හි මුඛ්‍ය ලක්ෂණ කවරේදැයි පහදන්න.

11. කණිෂ්ක අධිරාජයාගේ ක්‍රියා කලාපය හා කාර්ය සංසිද්ධිය ප්‍රමාණ කරන්න.

12. පුරාතන ඉන්දියාව හා විදේශ රටවල් අතර පැවැති වාණිජ සබඳතා සාකච්ඡා කරන්න.